# SAMAGI LAWYERS FEDERATION

සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி
Samagi Jana Balawegaya

**President**
Mr. Upul Jayasuriya P.C
Tel: 0773251381

**General Secretary**
Mr. Sudath Wickramaratne
Tel: 0777474751

**Treasurer**
Mr. Nalin Dissanayake P.C
Tel: 0777655609

**National Organizer**
Mr. Kamal Wijesiri
Tel: 0777627882


2026-07-27

## <u>යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව වන මාධ්‍ය නිවේදනයයි.</u>

වර්තමාන ජනාධිපතිවරයා ප්‍රමුඛ ජාතික ජනබලවේග (මාලිමා) රජය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගැනීමේ වයස් සීමාව දීර්ඝ කිරීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය කැබිනට් මණ්ඩලය වෙත 2026-07-27 දින ඉදිරිපත් කරන ලද බවට මාධ්‍ය වාර්තා කර ඇත.

2024 පැවති ජනාධිපතිවරණයේ දී සහ පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජාතික ජනබලවේගය (මාලිමාව) විසින් ජනතාවට ඉදිරිපත් කරන ලද ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වන ලද්දේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලබන අතර එය මහජනතාව වෙත ඉදිරිපත් කර, සංවාදයකින් අනතුරුව වෙනස්කම් සිදු කොට ජනමත විචාරණයක් මඟින් සම්මත කරගනු ලබන බවය. එම යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන කරුණු අතර විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙකු පත් කිරීම ද නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීමද යන කරුණු ඇතුළත් විය.

**එහෙත්** මාලිමා රජය ලද ජනවරමට සම්පූර්ණයෙන් පටහැනිව සහ අත්තනෝමතිකව උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීම සඳහා වූ යෝජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කිරීම සඳහා ඉහත කී පරිදි මාලිමා රජය ලහිලහියේ කටයුතු කරමින් සිටියි. මෙම සංශෝධනය රැගෙන එන්නේ නඩු කටයුතු ඉක්මන් කිරීමටය යන සාවද්‍ය සහ අතාර්කික තර්කය ජනාධිපතිවරයා සහ මාලිමා රජය ගෙන එයි. එය මෙම සංශෝධනය රැගෙන ඒමේ සැබෑ අර්ථය වන්නේ අනිසි ලෙස බලයේ රැදී සිටීම සඳහා වන ඔවුන්ගේ රහසිගත න්‍යායපත්‍රය සැඟවීම සඳහාය. මෙම බොලඳ තර්කය ගෙන එනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුධූර හතරක් සහ අභියාචනාධිකරණයේ විනිසුරුධූර හතරක් සඳහා ජනාධිපතිවරයා විසින් පත් කිරීම් සිදු නොකරය.

මෙම යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ශ්‍රී ලංකාවේ නීතීඥ සංගමය ද, දිවයිනේ විවිධ නීතීඥ සංගම් ද අධිකරණ නිලධාරීන්ගේ සංගමය ද, සමගි නීතීඥ සම්මේලනය ද, ජාත්‍යන්තර නීතීඥ සංගම් ද ඔවුන්ගේ විරෝධතා මේ වන විටත් දක්වා ඇත. මෙම සංශෝධනය කිසිවෙකු ද ඉල්ලා නැත. මෙය සිදු කරන්නේ ජනාධිපතිවරයා සහ මාලිමා රජය ඔවුන්ගේ බලය රැක ගැනීම සඳහා අධිකරණ ස්වාධීනත්වයට සහ නීතියේ ආධිපත්‍යයට කරනු ලබන බලපෑම් ලෙසටය.

පසුගිය දශක පහකට අධික කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ නීතීඥ සංගමය (BASL) සැමවිටම නීති වෘත්තිකයන්ගේ හඬ විය. ශ්‍රී ලංකා නීතීඥ සංගමය යනු අධිකරණ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය සුරැකීම උදෙසා අඛණ්ඩවම සහ ක්‍රියාකාරීව කැපවුණු සහ දැනුදු එසේ කැපවෙන ස්වාධීන සංගමයකි. එහි ක්‍රියාදාමයන්ට අපි ගරු කරන අතරම ඒවාට අපි එකඟ වෙමු.

ඒ අනුව අධිකරණ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍ය සුරැකීම සඳහා 2026-07-29 (බදාදා) දින පැවැත්වීමට යෝජිත ශ්‍රී ලංකාවේ නීතීඥ සංගමයේ විශේෂ මහා සභා රැස්වීමට අපගේ පූර්ණ ආශිර්වාදය මෙයින් අපි පලකර සිටිමු. එකී රැස්වීමට සහභාගි වී මෙරට අධිකරණ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍ය සුරැකීමට දායක වන ලෙසට සමස්ත නීතීඥ ප්‍රජාවෙන් අපි ඉල්ලා සිටිමු.

ජාතික සංවිධායක

ප්‍රධාන ලේකම්